# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2295/08 - 2022 අගෝස්තු මස 31 වැනි බදාදා - 2022.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 6 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 6 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියමය මගින්, 2022 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි 2022 මැයි 31 දිනැති අංක 2282/26 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළකල නියමය, එහි 1 ඡේදයේ (ආ) උප ඡේදයට පහත උප ඡේදය ආදේශ කිරීම මගින් සංශෝධනය කරමි.

"(ආ) මෙම ඡේදයේ (අ) උප ඡේදය යටතේ දක්වා ඇති භාණ්ඩ ආනයනය හැර අනෙකුත් භාණ්ඩ ආනයනය සහ/හෝ සැපයීම හෝ සේවා සැපයීම මත සියයට පහළොවක (15%) අනුප්‍රමාණයට,"

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 31 වන දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 09-003



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*